මගේ අංකය - ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2026

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු - 2026**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පරිදි සිදු කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු නියෝග මේ සමඟ අමුණා ඇති **ඇමුණුම - A** (Annexure -A) හි සඳහන් වේ.

- **උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු 2026 මාර්තු මස 16 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

- **අධිකරණ ලසු ලේඛක සේවයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු එම සේවාවට අදාළ නව බඳවා ගැනීම් සමඟ සලකා බැලීමට නියමිත අතර 2026.03.02 හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ තනතුරු ආශ්‍රිතව අධිකරණවල දැනට පවතින උග්‍ර නිලධාරී හිඟය හැකිතාක්දුරට කළමනාකරණය වන පරිදි හා ඒ ඒ අධිකරණවල පවතින අවස්ථානුගත තත්ත්වයන් ද (එනම් නඩු සංඛ්‍යාව, අනුමත කාර්ය මණ්ඩලය, කාර්ය මණ්ඩල පුරප්පාඩු සහ නව අධිකරණ පිහිටුවීම යනාදිය) හා නිලධාරීන්ගේ ඉල්ලීම් හැකිතාක්දුරට සලකා බලමින් මෙම ස්ථානමාරුවීම් සිදුකර ඇත. කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා අනුප්‍රාප්තිකයෙකු ලබාදිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු නව බඳවාගැනීම් මඟින් ලබාදීමට සටහන් කරගෙන ඇත.

02. වර්තමාන සේවා ස්ථානයේ වසර 04 සම්පූර්ණ කරන ලද එක් එක් සේවාවන්ට අයත් නිලධාරීන් විසින් නම් කරන ලද ස්ථාන පහෙන් (05) එකක් ලබා දීමට හැකිතාක්දුරට කටයුතු කර ඇති අතර එසේ නම් කරන ලද ස්ථානයක් ප්‍රායෝගිකව ලබාදිය නොහැකි අවස්ථාවලදී පමණක් නිලධාරීන් පදිංචි ස්ථානයන්ට සාපේක්ෂව ආසන්නතම වෙනත් සේවා ස්ථානයක් ලබා දී ඇත.

තව ද වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇතත් මේ අවස්ථාවේ දී ස්ථාන මාරු ලබා දී නොමැති නිලධාරීන්ගේ ඉල්ලීම් සඳහා ඉදිරියේ දී ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. වර්තමාන සේවා ස්ථානයේ නියමිත කාල සීමාව සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට සේවා අවශ්‍යතාවය මත ලබා දී ඇති ස්ථාන මාරු ද වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ සඳහන් වේ.

සුදුසු අනුප්‍රාප්තිකයන් නොමැති වීමේ හේතුව මත නියමිත කාලයට වැඩි කාලයක් වර්තමාන සේවා ස්ථානයන්හි (දුරබැහැර සේවා ස්ථානයන්හි) සේවය කරන ලද නිලධාරීන්ට වුවද පහසු සේවා ස්ථානයන්ට ස්ථාන මාරු ලබා දී නොමැති විය හැකිය. එවැනි ඉල්ලීම් නව බඳවා ගැනීම් මඟින් අනුප්‍රාප්තිකයින් ලද විට වහාම ඉටු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

03. අධිකරණවල පවතින පුරප්පාඩුවලට සාපේක්ෂව අඩු ඉල්ලුමක් ඇති අධිකරණ සංකීර්ණ වන **කොළඹ, පුත්තලම සහ අම්පාර** යන අධිකරණ සංකීර්ණයන්හි නිලධරයන් විෂයෙහි 2025.08.20 දිනැති වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ 03 වන ඡේදය ව්‍යතිරේඛී අවස්ථාවක් සේ සළකා කටයුතු කර ඇත.

04. ස්ථාන මාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.
- අඩවැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.
- අඩවැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථාන මාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුවය.

05. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ස්ථානමාරු සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සඳහා හිමිකම ඇත. කෙසේ වෙතත් වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ **එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත** අදාල ස්ථාන මාරු නියෝග කර ඇත්නම් පමණි.

06. මෙම ස්ථාන මාරු නියෝග නිලධාරීන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් සහ උපලේඛනගත සේවයේ කාර්ය මණ්ඩලය සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරි කාර්ය මණ්ඩලය ඒ ඒ අධිකරණයන්හි සේවා අවශ්‍යතාවයන් මත බෙදී යන පරිදි සිදු කරනු ලැබ ඇති හෙයින් නියමිත පරිදි නිලධාරීන් මුදා හැරීම සිදු කරනු නොලැබුවහොත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද මානව සම්පත් කළමනාකරණ සැලසුම් කිරීම ක්‍රියාත්මක නොවන හෙයින් **ස්ථාන මාරු නියෝග අනුව සියලුම නිලධාරීන් නියමිත පරිදි මුදාහැරීමට ක්‍රියා කළ යුතුය.**

මෙම ස්ථාන මාරු නියෝග එපරිද්දෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳ වගකීම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව තිබූ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පැවරෙන බව මෙයින් අවධාරණය කෙරේ. (මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 27 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.)

07. තවද නඩු භාණ්ඩ භාරකරුවන් වශයෙන් ක්‍රියා කරන නිලධාරීන් ස්ථාන මාරුවී යාමට ප්‍රථම අවසන් කළ යුතු කටයුතු නොපමාව අවසන් කළ යුතු බවද එම කටයුතු සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීමෙන් පසු නැවත අනුයුක්ත කිරීමක් සිදු නොකරන බවද කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙනු ලැබේ. එවැනි නිලධාරීන් ද ඉහත 06 ඡේදයේ පරිදි මුදා හැරිය යුතු වේ.

**08. ඉල්ලා ඇති අධිකරණ පහෙන් එකකට හෝ එම අධිකරණ පිහිටි අධිකරණ සංකීර්ණයක වෙනත් අධිකරණයකට ස්ථාන මාරු ලැබී ඇති නිලධාරීන්ගේ අභියාචනා ඉදිරිපත් නොකල යුතුය.**

09. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා එවීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාල නිල වෙබ් අඩවියේ එල කර ඇති උපදෙස් අනුව අයදුම්පත් සකසා **2026.02.16** වන දින පස්වරු 3.00 හෝ එදිනට පෙර ඊමේල් (E-mail) මඟින් ඉදිරිපත් කළ යුතු අතර එහි දෘඩ පිටපත එක් එක් සේවා ශ්‍රේණි අනුව වෙන් වෙන්ව 2026.02.17 දිනට ප්‍රථම ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ ***"වාර්ෂික ස්ථානමාරු අභියාචනා 2026, පිරිස් පාලන අංශය "*** යනුවෙන් සඳහන් කර ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, අලුත්කඩේ, කොළඹ - 12 යන ලිපිනයට එවිය යුතුය.

ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2026 පෙබරවාරි මස 10 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.